# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01.තාක්ෂණ නිලධාරී ( කොන්ත්‍රාත් පදනම මත )

**අවශ්‍ය සුදුසුකම් :**

1) අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාරගණනකදී විෂයන් 06 කින් සමත් වීම සහ විද්‍යාව සහ ගණිතය යන විෂයන් ඇතුලුව සම්මාන සාමාර්ථ 05 ක් තිබිය යුතුවේ.

**සහ**

2) අ. පො. ස උසස් පෙළ විභාගය විද්‍යා අංශයෙන් විෂයන් 03කින් සමත් වී තිබිය යුතුවේ.

❖ ඉහත සඳහන් කළ සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් පහත සුදුසුකම් ලබා තිබිය යුතුය.
- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
- අයදුම් කිරීමේ අවසන් දිනයට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුය
- හොඳ චරිතයක් විය යුතුය

වැටුප : රු 31,625 ( ස්ථාවර වැටුප ) +රු17,800 (ජීවන වියදම් දීමනාව ) + රු.5,000 ( රජයේ අනුමත දීමනාව ) = රු 54,425

( මීට අමතරව සේවක භාරකාර අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල සඳහා විශ්වවිද්‍යාලය මඟින් දායක මුදල ගෙවීම හා සේවකයා මඟින් දායක මුදල ගෙවීම අදාළ වේ.)

## 02. තාක්ෂණ නිලධාරී ICT ( කොන්ත්‍රාත් පදනම මත )

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ. පො. ස උසස් පෙළ විභාගය ඕනෑම විෂය ධාරාවකින් විෂයන් 03 කින් එකවර සමත් වී තිබිය යුතුවේ.

**සහ**

2. තොරතුරු සන්නිවේදන සහ බහුමාධ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ පිළිගත් ආයතනයක් විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය හෝ ඊට සමාන අංශයකින් N.V.Q මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

➢ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සේවා පළපුරුද්ද ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

❖ ඉහත සඳහන් කළ සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් පහත සඳහන් පශ්චාත් නිශ්චිත සුදුසුකම් ලබා තිබිය යුතුය.
- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
- අයදුම් කිරීමේ අවසන් දිනයට වයස අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය.
- හොඳ චරිතයක් විය යුතුය

වැටුප : රු 31,625 ( ස්ථාවර වැටුප ) +රු17,800 (ජීවන වියදම් දීමනාව ) + රු.5,000 (රජයේ අනුමත දීමනාව ) = රු 54,425

( මීට අමතරව සේවක භාරකාර අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල සඳහා විශ්වවිද්‍යාලය මඟින් දායක මුදල ගෙවීම හා සේවකයා මඟින් දායක මුදල ගෙවීම අදාළ වේ.)

## 03.කළමනාකරණ සහකාර ( කොන්ත්‍රාත් පදනම මත )

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය එකවර විෂයන් 06කින් සහ පහත සඳහන් විෂයන් සඳහා සම්මාන සාමාර්ථ තිබිය යුතුවේ.

    - සිංහල / දෙමළ
    - ඉංග්‍රීසි භාෂාව
    - ගණිතය

2. අ. පො. ස උසස් පෙළ විභාගයේ සියලුම විෂයන් එකවර සමත් වී තිබීම. ( සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර )

3. පහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

    අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට නොඅඩු කාලසීමාවක පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකම්

    සහ

    ආ) පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබඳ වසර් දෙකක පළපුරුද්ද

❖ ඉහත සඳහන් කළ සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් පහත සඳහන් පශ්චාත් නිශ්චිත සුදුසුකම් ලබා තිබිය යුතුය.
- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
- අයදුම් කිරීමේ අවසන් දිනයට අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය
- හොඳ චරිතයක් විය යුතුය

වැටුප : රු.30,725 ( ස්ථාවර වැටුප ) +රු.17,800 (ජීවන වියදම් දීමනාව ) + රු.5,000 (රජයේ අනුමත දීමනාව) = රු. 53, 525

( මීට අමතරව සේවක භාරකාර අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල සඳහා විශ්වවිද්‍යාලය මඟින් දායක මුදල ගෙවීම හා සේවකයා මඟින් දායක මුදල ගෙවීම අදාළ වේ.)

## 04.රියදුරු (කොන්ත්‍රාත් පදනම මත )

**අවශ්‍ය සුදුසුකම් :**

- අටවන ශ්‍රේණිය සමත් වීම.
- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කර ඇති බර වාහන පැදවීම සඳහා වූ ( මෝටර් කෝච් ) බලපත්‍රය තිබිය යුතුය.
- රිය පැදවීම පිළිබඳව අවම වශයෙන් වසර 3ක පළපුරුද්දක් තිබිය යුතුවේ.
- ධාවන අළුත්වැඩියාවන් කර ගැනීමේ හැකියාව තිබිය යුතුවේ.
- අවම වශයෙන් උස අඩි 05 අඟල් 2 1/2 විය යුතුය.
- මාර්ග සංඥා නීති රීති පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය.

- දිවා කාලයේ මෙන්ම රාත්‍රී කාලයේ ද සේවය කිරීම සඳහා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත සහ ඇස් පෙනීම සතුටුදායක විය යුතුය.

වැටුප : රු29,915 ( ස්ථාවර වැටුප ) +රු17,800 (ජීවන වියදම් දීමනාව ) + රු5,000 (රජයේ අනුමත දීමනාව ) = රු. 52,715

( මීට අමතරව සේවක භාරකාර අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල සඳහා විශ්වවිද්‍යාලය මඟින් දායක මුදල ගෙවීම හා සේවකයා මඟින් දායක මුදල ගෙවීම අදාළ වේ.)

## 05. වැඩ සහයක (කොන්ත්‍රාත් පදනම මත )

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින් සමත්ව තිබිය යුතුය.

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
- අයදුම් කිරීමේ අවසන් දිනයට අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය
- හොඳ චරිතයක් සහ මනා ශාරීරික සෞඛ්‍යයක් තිබිය යුතුය

වැටුප : රු.27,025 ( ස්ථාවර වැටුප ) +රු.17,800 (ජීවන වියදම් දීමනාව ) + රු.5000 (රජයේ අනුමත දීමනාව ) = රු. 49,825

( මීට අමතරව සේවක භාරකාර අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල සඳහා විශ්වවිද්‍යාලය මඟින් දායක මුදල ගෙවීම හා සේවකයා මඟින් දායක මුදල ගෙවීම අදාළ වේ.)

**ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළ සෙසු කරුණු:-**

- අයදුම් කරන තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු වලට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනීම සිදු කෙරේ.

- කොන්ත්‍රාත් කාලය මාස 06ක් වන අතර සේවා ඵලදායීතාවය හා විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ තීරණය මත කොන්ත්‍රාත් කාලය තවදුරටත් දීර්ඝ කරනු ලැබිය හැක. එසේ දීර්ඝ කිරීම හෝ දීර්ඝ නොකිරීම සම්බන්ධව සම්පූර්ණ බලතල විශ්වවිද්‍යාලයීය පාලක සභාව සතුවේ.

**අයදුම්පත් යොමු කිරීම**

- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙන් බාගත කරන ලද අයදුම්පත් නිසිපරිදි සම්පූර්ණ කර අධ්‍යාපනික සහ සෙසු සහතික වල සහතික කරන ලද පිටපත් ද සමඟ , **2024 මැයි මස 06** වන දිනට පෙර ලැබෙන පරිදි **" සහකාර ලේඛකාධිකාරී, ආයතන අනධ්‍යයන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ ගෙනවිත් භාරදීම කළ යුතුවේ.

- අයදුම්කරන තනතුර , අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුවේ.

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී,**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය**